
# 2550

# ශ්‍රී සම්බුද්ධ ජයන්තිය



ශ්‍රී දළදා මාළිගාව - මහනුවර



දළදා කරඬුව


# සෙංකඩගලපුර වැඩ වසන
# දළදා සමිඳු

**මහාචාර්ය අනුරාධ සෙනෙවිරත්න විසිනි**
(සම්මාන මහාචාර්ය - පේරාදෙණිය විශ්වවිද්‍යාලය)

සෙංකඩගලපුරය හෙවත් මහනුවර වනාහි දහසය වැනි සියවසේ ආරම්භයේ පිහිටුවන ලද කන්ද උඩරට රාජධානියේ අග නගරය වූයේය. එතෙක් පැවැති සම්ප්‍රදාය අනුව දළදා වහන්සේගේ භාරකාරත්වය නැති කිසිවෙකුටත් රාජ්‍ය උරුමය හිමි නොවීය. පොළොන්නරු යුගයේ ආරම්භයත් සමඟ ඇති වූ මෙම සිරිත රාජධානි වෙනස් වූ සෑම අවස්ථාවකදීම සිදුව පැවති බැවින් කන්ද උඩරට රාජධානියේ උපතත් සමඟම එදා රත්නපුර දෙල්ගමුව රජමහ විහාරයේ සඟවා තිබූ දන්ත ධාතූන් වහන්සේ මහනුවරට වැඩම වූයේ අභිනවයෙන් එහි නරපතියා වශයෙන් කිරුළ පැළඳි පළමු වන විමලධර්මසූරිය රජතුමන්ගේ රාජ්‍ය අයිතිය තහවුරු කිරීම හා නීත්‍යානුකූල කිරීම උදෙසාය. රාජ්‍ය වර්ෂ වශයෙන් සලකන කල මෙම රාජ්‍ය පදවි ප්‍රාප්තිය සිදු වී ඇත්තේ 1592 දීය.

කන්ද උඩරට රාජධානියේ උපත පිළිබඳව කෙටියෙන් යමක් සඳහන් කළහොත් ප්‍රථමයෙන් කිව යුත්තේ සෙංකඩගල පුරවරය බිහිවූයේ උඩරට රාජධානිය බිහිවීමට ශතවර්ෂයකට පෙරාතුව බවය. ඒ නම් සේනාසම්මත වික්‍රමබාහු (1469 - 1511) රජුගේ රාජ්‍ය කාලයේදීය. කන්ද උඩරට රාජධානියේ උපත පිළිබඳව ඇති කතා පුවත අවුල් සහගතය. ඉතිහාස කරුණු මැනවින් හා නිරවුල්ව පෙළගස්වා ගැනීමට ඇති මූලාශ්‍ර මඳකම නිසා කරුණු දැක්විය හැක්කේ ඒවා විවාදාත්මක බව හඟවමිනි. පහළොස්වන සියවසේදී හයවන පරාක්‍රමබාහු (1411 - 1467) රජතුමන් කෝට්ටේ රාජධානිය පාලනය කරන සමයේදී එතුමන් වෙනුවෙන් උඩරට ප්‍රදේශ පාලනය කරන ලද්දේ ජෝතිය සිටාණන් හා ගම්පල ඇපාණන් විසින් බව මඩවල සෙල්ලිපියෙන් පැහැදිලිවේ. එහෙත් උඩරට රාජධානියේ නිදහස් සටන එතැනින් අවසන් වූයේ නැත. පරාක්‍රමබාහු රජුගේ අභාවයත් සමඟ උඩරට නිදහස් සටන යළි පණගැන්වී ආවේය. ගම්පල රජපෙළපතට අයත් ඉහත සඳහන් කළ සේනාසම්මත වික්‍රමබාහු උඩරට රාජධානියේ ප්‍රභවයට පදනම දැමූ ප්‍රථම රජතුමන් බව පිළිගතයුතු ඓතිහාසික සත්‍යයකි. ඔහුගෙන් පසු රජවූයේ ජයවීරය (1551 - 1551) ඔහුට තර්ජනයක් වූයේ එකල උඩරට ප්‍රධානියෙකු වූ කරල්ලියද්දේ ගෙනි. මොහුගේ






සොහොයුරිය වූ දෝන ගාර්ගරිදා කෝට්ටේ ධර්මපාල සමඟ විවාහ වූවාය. කරල්ලියද්දේගේ එකම දියණිය දෝන කතිරිනා වූ අතර පවුලේ සියලුදෙනා කතෝලිකයෝ වූවාය. කරල්ලියද්දේ උඩරට රජවූයේ 1551 දීය. (1551 - 1581) මෙකල සීතාවකද රාජධානියක් ව පැවැතියේය. ඥාති සම්බන්ධකම් හා කතෝලික ආගමික සම්බන්ධතා පදනම තුළින් කෝට්ටේ හා සෙංකඩගලපුර අතර මිත්‍රත්වයක් පැවතුන අතර පෘතුගීසින්ගේ සහයෝගය ද ඒ සඳහා ලැබිණ. එහෙත් කෝට්ටේ හා මහනුවර යන දෙතැනටම තර්ජන ඇතිවූයේ සීතාවක රාජසිංහයන්ගෙනි. (1581 - 1591) කරල්ලියද්දේගේ මරණින් පසු එහි රජකමට හිමිකම් පෑවේ දෝන කතිරිනා වුවද පෘතුගීසි අනුග්‍රහයෙන් රජකම ලබාගත්තේ දොන් පිලිප් හෙවත් යමසිංහ බණ්ඩාරය. මේ සියලු දෙනා කතෝලිකයෝ වූහ. සීතාවක රාජසිංහ 1591 දී අභාවප්‍රාප්ත වූයෙන් ඒත් සමඟ යමසිංහ බණ්ඩාරද ඝාතනය විය. එබැවින් දෝන කතිරිනා මහ රැජින වශයෙන් තබාගෙන රාජ්‍ය පාලනයට පෘතුගීසින් උත්සාහ දැරුවද 1592 දී දොන් ජුවන් හෙවත් කොනප්පු බණ්ඩාරගේ මූලිකත්වයෙන් දන්තුරේදී පෘතුගීසින්ට විරුද්ධව සිදුවූ සටනින් ජය ඔහුට හිමිවිය.

මේ අනුව කන්ද උඩරට ස්වාධීන රාජ්‍යයක් වශයෙන් බිහි වූ අතර එහි නව පාලකයා වූයේ පලමුවන විමලධර්මසූරිය නමින් රජවූ කොනප්පු බණ්ඩාරය. ඔහු ද කතෝලිකයෙකු වූ නමුදු ස්වකීය බවුතීස්ම නාමය මෙන්ම ආගමද අතහැර දමා බෞද්ධ රජකෙනෙකු වශයෙන් යළි උපත ලැබුවේ දෝන කතිරිනා කුමරිය හෙවත් කුසුමාසන දේවිය ද අග බිසවුන් තනතුරෙහි තබා ඇයගේ රාජ්‍ය අයිතියද උරුමකර ගනිමිනි. දැන් මෙම රජුට අවශ්‍ය වූයේ දළදා වහන්සේ අත්පත්කර ගැනීමටය. සීතාවක රාජසිංහයන් නැති කාලයක දෙල්ගමුව රජමහාවිහාරයේ කුරහන් ගලක සඟවා තිබූ දළදා සමිඳු මහනුවරට වඩමවා ගෙන විත් හැම අතින්ම රාජ්‍ය තහවුරු කර ගැනීමට විමලධර්මසූරිය සමත් විය. කන්ද උඩරට රජ පෙළපතක් මෙන්ම දළදා සමිඳුගේ භාරකාරත්වයක් මේ සමඟ උඩරට වැසියන් අතට පත්විය.

පළමුවන විමලධර්මසූරිය රජතුමා ස්වකීය රජ මාලිගයේ මිදුලේ ඉතා සිත්කළු දෙමහල් දළදා මන්දිරයක් ගොඩ නංවා දළදා වන්සේ එහි තැන්පත් කළේය. ඔහුගේ ඇවෑමෙන් වර්ෂ 1603 දී තම ඥාති සොහොයුරු රාජ්‍යයට පත්විය. මෙකල පෘතුගීසි සතුරු කරදර නිතර ඇති වූ අවධියකි. මේ නිසා රාජ්‍යයේත් දළදා වහන්සේගේත් ආරක්‍ෂාව පිණිස සෙනරත් රජු විසින් එම පූජනීය වස්තුව දුම්බර පන්සිය පත්තුවේ මැද මහනුවරට වැඩමවා ගෙන ගොස් එහි තැන්පත් කරන ලදී. සෙනරත් රජුද මේ කාලයේ ජීවත් වූයේ අළුත්නුවර යයි නම් ලැබූ මහියංගනයේය. ඔහුගේ පුතෙකු වූ දෙවන රාජසිංහ වර්ෂ 1635 දී මහනුවර රජකමට පත් වී පෘතුගීසින් ද පළවා හරිමින් සාමකාමී අවදියක් ඇති කළේය. ඔහු දළදා වහන්සේ නැවත මහනුවරට වැඩම කළේ පෙර පැවැති දළදා මැඳුරු භූමියේ නව දෙමහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීමෙන් පසුවය. මේ කාලය වන විට මහනුවර ඇසළ පෙරහැර පැවැත්වූයේ දෙවියන් උදෙසා බව අමතක නොකළ යුතුය. එකල දළදා පෙරහරක් නොවීය. දෙවන රාජසිංහයන්ගෙන් පසු ඔහුගේ පුත් දෙවන විමල ධර්මසූරිය රජතුමා වර්ෂ 1687 දී මහනුවර රජවිය.

මෙම රජතුමන් විසින් සිදු කරන ලද වැදගත් කාර්යයන් අතර දළදා වහන්සේ උදෙසා මනෝහර වූ තුන්මහල් පහයක් ද මනෝඥ වූ කරඬුවක්ද වූ අතර රන් ආලේප කොට නවරත්නයන් ඔබ්බවා මහකරඬුවක් ද කරවා පූජා කළ බව සඳහන් වේ. ඔහුගේ පුත් නරේන්ද්‍රසිංහ වර්ෂ 1707 දී රජකමට පත්ව 1739 දක්වා රාජ්‍ය පාලනය කළේය. ඔහු කන්ද උඩරට අන්තිම සිංහල රජු විය. චූලවංසය ඔහුගේ ආගමික කටයුතු මහ ඉහළින් වර්ණනා කර ඇත. සිය පියාණන් කළ දළදා මැඳුර දිරාපත් වෙමින් පවතින බව දුටු ඔහු දෙමහල් පහයක් කරවා මාලක දෙකෙහි දෙතිසක් ජාතක චිත්‍ර අන්දවා විසිතුරු කළ බව සඳහන් වේ. අද අප දකින දළදා මැඳුර එයයි. එහෙත් එදා අඳින ලද චිත්‍ර අද දක්නට





නොමැත. දළදා සමිඳු වැඩසිටි මැඳුර රජමාලිගෙහිම කොටසක් වූ අතර දළදා සමිඳු භාරව සිටියේ රජතුමන්ය. භික්‍ෂූන් වහන්සේ සම්බන්ධ වූයේ දළදා වතාවත් සිදු කිරීම සඳහා පමණි. නරේන්ද්‍රසිංහ රජුට අනතුරුව රජවූයේ ශ්‍රී විජයරාජසිංහයි. ඔහුගේ රාජ්‍ය කාලය වූයේ 1739 - 1747 දක්වා ය. එතුමන්ගේ කාලය සම්බන්ධයෙන් අප අතර වාර්තා නැති අතර වර්ෂ 1747 සිට 1781 දක්වා රජකළ කීර්ති ශ්‍රී රාජසිංහ රජු දවස පැවති ලන්දේසි ආක්‍රමණ නිසා දළදා සමිඳු යළි මැද මහනුවර සඟවා තබා විනාශවී ගිය දළදා මැඳුර හා දා කරඬුව යළි සකස්කොට 1770 දී මහනුවරට වැඩමවා ඇති බවට වෙනත් මූලාශ්‍රවලින් ලැබෙන තොරතුරුවලින් පෙනීයයි. මේ රජු අවදියේම දළදා පෙරහැර ආරම්භ වීමත් විශේෂ සිද්ධියක් කොට සැලකිය හැක. කීර්ති ශ්‍රී ගෙන් පසු බලයට පත් රාජාධිරාජසිංහ වර්ෂ 1781 සිට 1798 දක්වා රජකළ නමුත් දළදාව වෙනුවෙන් කළ පූජා කර්මයක් ගැන විශේෂයෙන් සඳහන් නොවේ. එතැන් පටන් 1815 දී උඩරට රාජධානියේ බිඳ වැටීම තෙක් රාජ්‍ය කළ ශ්‍රී වික්‍රම රාජසිංහ රජුගේ කාලයේදීද විශේෂ යමක් සිදු වී නැති අතර අද දින දළදා මාලිගාවේ කොටසක්ව පවතින එහෙත් එදා රජමාලිගයට සම්බන්ධ පත්තිරිප්පුව රාජකීය ගොඩනැගිලි සංකීර්ණයට එකතු වී ඇත.


දළදා මාලිගාව සම්බන්ධ වර්තමාන ඉතිහාසය ගැන කරුණු සැලකීමේදී 1936 වර්ෂයේදී පී. බී. නුගවෙල දිසාව විසින් කරන ලද සංවර්ධන කටයුතු මෙන්ම 1956 බුද්ධ ජයන්ති මහෝත්සවය වෙනුවෙන් රජය විසින් කරන ලද ප්‍රතිසංස්කරණ කටයුතු ද ඒ සඳහා සී.බී. නුගවෙල දිසාවගේ සහභාගිත්වයද සඳහන් කළ යුතුය. මේ දෙදෙනාම වූ කලී දළදා මාලිගාවේ හිටපු දියවඩන නිලමේවරුන් දෙදෙනෙකි. ඉතාමත් මෑත යුගයේදී වාර්තා වන සිද්ධීන් අතර දළදා සමිඳු වැඩ වෙසෙන කුටියට ආරක්ෂාව සපයා දෙමින් දිවංගත ජනපති රණසිංහ ප්‍රේමදාසයන් විසින් එක්කළ රන්වියන එහි වාස්තු විද්‍යාත්මක ඉතිහාසයේ තවත් වැදගත් අවස්ථාවකි. මේ කටයුතු වාර්තාවන්නේ 1987 වර්ෂයේදීය. වර්ෂ 1998 ජනවාරි 25 වැනිදා මාලිගාවට එල්ල වූ ත්‍රස්තවාදී ප්‍රහාරය නිසා ගොඩනැගිලි රාශියක් විනාශ වී ගිය අතර ලක් රජය මෙන්ම මහජනතාවගේ නොමසුරු ආධාරයෙන් යළි දළදා මාලිගාවේ ශ්‍රී විභූතිය ආරක්ෂා වන අයුරින් සංරක්ෂණය කිරීම බෞද්ධ ලෝකයාගේ ගෞරවයට හා ප්‍රශංසාවට හේතුවන කරුණකි.

දළදා මාලිගාවේ භාරකාරත්වය සම්බන්ධයෙන් බලන කල පෙර දවස රජතුමන්ගේ භාරයේ පැවති දළදා හිමි ඉංග්‍රීසි පාලන යටතේදී එනම් 1853 දී මල්වතු අස්ගිරි මහානායක හිමිවරුන් දෙදෙනා වහන්සේ ප්‍රමුඛව දියවඩන නිලමේට භාරවීමත් ඒ මගින් පෞරාණික චාරිත්‍රයක් මෙන්ම උරුමයක් වෙනස් වී ගිය අන්දම ගැනද කරුණු සඳහන් කිරීමට සිදු වී ඇත.

මේ කාරණා කෙසේ වුවද එදා සිවුවැනි සියවසේ කීර්ති ශ්‍රී මේඝවර්ණ රජ දවස (301 - 328) ලක්දිව අනුරාධපුර අගනුවරට වැඩම වූ දළදා වහන්සේ ඉන් අනතුරුව ලක්දිව හැම රාජධානියකම පාහේ වැඩමවා අවසාන වශයෙන් කන්ද උඩරට සෙංකඩගලපුරට වැඩම කළේය. ඉන්පසු රාජධානියේ බිඳවැටීමත් ඉංග්‍රීසින් අතට මුළු මහත් දිවයිනේ පාලනය පත් වීමත් සමග දළදා වහන්සේගේ රාජධානි ගමන අවසන් වී ස්ථිරවම මහනුවර සෙංකඩගල පුරවරයට වැඩම වීමට සිදුවීම අද දේශපාලන හා සමාජ බලවේග වශයෙන් වෙන් වී සිටින ජන කොටස අතරින් උඩරට ජනයාගේ සාඩම්බරයට හේතු වන කරුණකි. එසේම එය සකල ලංකාවාසී ජනතාවගේ ගෞරවයට හා අභිමානයට හේතුවන කරුණක් වශයෙන් ද සඳහන් කළ හැක.

දළදා වහන්සේගේ අයිතිය රාජ්‍ය පාලනයට සුදුසුකමක් වීම පොළොන්නරු යුගයේ ආරම්භයත් සමඟම සිදු වූ ඓතිහාසික සිද්ධියකි. එවක් පටන් ලක් කිරුළ දැරීමට ඉදිරිපත් වූ සෑම රජකෙනෙකුම පාහේ උත්සාහ ගත්තේත්, සටන් කළේත් දළදාහිමි තමන් අතට පත් කර ගනිමින් රජකමට උරුමකම් කීමටය. කන්ද උඩරට මහනුවර රාජධානිය ආරම්භ වීමත් සමගම





පළමුවන විමලධර්මසූරිය රජතුමන් දෙල්ගමුවේ සිට මහනුවරට දළදා වහන්සේ වැඩම කළේත් ඒ හේතුවෙන් බව මින් පෙර පෙන්වාදෙන ලදී. වර්ෂ 1815 දී ඉංග්‍රීසින් විසින් උඩරට රාජ්‍යය හිමිකර ගැනීමත් සමඟම එය නීත්‍යානුකූල කරගැනීම පිණිස දළදා වහන්සේගේ භාරකාරත්වය තමන් වෙතට පත්කර ගැනීමට ගරුතර මහා සංඝයා වහන්සේ එකල රහසිගතව කොත්මලේ සඟවා තිබූ දළදා වහන්සේ යළි සොයා ගනිමින් මහනුවර නගරයට වැඩමවාගත් අයුරු ද එම සිද්ධියෙන් පසු බ්‍රිතාන්‍යයන් තමන්ගේ රාජ්‍යය තහවුරු කරගත් අයුරු ද ඉතිහාසයෙන් පෙනී යයි. එසේම 1817-18 උඩරට කැරැල්ල සිදු වූ අවස්ථාවේ දී වාරියපොළ හිමියන් විසින් දළදා වහන්සේ දළදා මාලිගයෙන් ඉවත්කොට ගෙන ගොස් කැප්පෙටිපොළ මහනිළමේට භාරදීම සහ ඒ නිසා බ්‍රිතාන්‍ය පාලකයන් කැළඹීමට පත් වූ ආකාරයද ඒ සඳහා වාරියපොල හිමියන්ට දඬුවම් ලබාදීම ද සඳහන් කළ යුතුය. රජකමේ උරුමය සඳහා දළදා හිමියන්ගේ මහිමය එබඳු විය. පරසතුරු උවදුරු පැවැති මහනුවර රාජ්‍ය සමය පුරාම දළදා වහන්සේ දළදා මාලිගයෙන් ඉවත් කොට මැද මහනුවර - හඟුරන්කෙත - කුණ්ඩසාලේ වැනි ස්ථානවල ආරක්ෂා සහිතව තැන්පත් කර තබා තේවා කටයුතු නිසි අයුරින්

සිද්ධකොට සාමකාමී වාතාවරණය යටතේ යළිත් මහනුවර දළදා මැදුරට වැඩම වා ආරක්ෂා කොට පුද පූජා දක්වා ඇති අයුරු ඉතිහාස කතා පුවත් අතුරින් මනාව පැහැදිලි වේ.


## දළදා මන්දිරය

දළදා මන්දිරයට පිවිසීම සඳහා දොරටු තුනක් ඇත. ප්‍රධාන දොරටුව බටහිර පැත්තේ ඉදිරි පසින් ද අනෙක් දෙක එහි දෙපසින් ද ඇත.

පාත මාලය කාමර දෙකකින් යුක්තය. එයින් පළමුවැන්න දිග්ගේ නමින් හැඳින් වේ. මෙය හේවිසි වයන මඩුවට ඉදිරියෙන් දේවාලවල දිග් ගෙයට අනුරූපව තනා ඇත. මෙය මුළුමනින්ම හිස් කාමරයකි. භික්ෂූන් වහන්සේ හා වන්දනා කරුවෝ උතුරු බිත්තිය අසල ඇති පියගැට පෙළින් බැස ආපසු යති. පාත මාලයේ නැගෙනහිරින් ඇති කාමරය නිතරම වසා තිබේ. රනින් කළ උපකරණ තැන්පත් කොට ඇති මේ කාමරය මහ අරමුදල නමින් හඳුන්වනු ලැබේ. ඉහළ මාලය කාමර තුනකින් යුක්ත ය. පළමුවැන්න හඳුන්කුඩමයි. එය විශාල පාත්‍ර දෙකකින් හැර මුළුමනින්ම හිස්ය. ඒ පාත්‍ර දෙකින් එකක් පිත්තලෙන් නිමවා ඇති අතර කිරිබත් පාත්‍රය නමින් එය හැඳින්වේ. එය වන්දනා කරුවන් විසින් අටවක හා පුන් පොහෝ දිනයන්හි ගෙනෙන ලද බතින් පුරවනු ලැබේ. අඩි 2 1/2 ක් උස විශාල තඹ පාත්‍රය අලුත් සහල් උත්සවය සඳහා වේ. එහෙයින් අලුත් සහල් මංගල්ලේ පාත්‍රය නමින් හැඳින්වේ. භික්ෂූන් වහන්සේ ද වන්දනාකරුවෝ ද පාත මාලයේ සිට මේ කාමරයට ඇතුල් වෙති. ඔව්හු මේ කාමරය පසු කොට හඳුන්කුඩම නමින් හැඳින්වෙන ඇතුල් කාමරයට පිවිසෙති. මේ විස්තරය පාත මාලයට ද මුළුමනින්ම ගැලපෙන බවක් පෙනේ. පාලි පොත්වල සඳහන් වන බුදුන් වහන්සේගේ ගන්ධකුටිය මීට සමාන බවක් පෙන්වයි. මම මේ කාමර දෙක පළමු හා දෙවන ඇතුළු කාමර යන නමින් හඳුන්වමි.

නැගෙනහිරින් ඇති කාමරයට පිවිසෙන දොරටුව ඉහළින් කුඩා පිත්තල පද්මයක් එල්ලා තිබේ. මේ කාමරය ගන්ධ කුටියයි. ඔවුහු මීට ඇතුළු මාලිගාව හෝ වැඩ සිටින මාලිගාව යයි කියති. පසුපස බිත්තියට සවි කරන ලද ඔප දැමූ යකඩ පොලුවලින් තුන්පැත්තකින් ආවරණය කරන ලද කුටියේ දළදා වහන්සේ තැන්පත් කොට ඇත්තේය. මේ යකඩ පොලු බ්‍රිතාන්‍ය ආණ්ඩුව මගින් යොදන ලද ඒවාය. ඊට කලින් එබඳු කිසිවක් එහි නොවීය. මෙසේ බ්‍රිතාන්‍ය ආණ්ඩුව විසින් යකඩ පොලුවලින් කරන ලද ආවරණය වෙනුවට වීදුරු ආවරණයක් අද දක්නට ලැබේ. දළදා වහන්සේ තැන්පත් කළ කරඬුව





ස්වර්ණමය මිටි සිංහාසනයක් මත තබා තිබේ. මේ සියල්ල මුදුනෙන් කපා ඔප දමන ලද පිරමීඩයක් වැනි වීදුරු ආවරණයකින් වසා ඇත. ඉදිරියෙන් ඇති දැව රාමුවේ මූණත බෙහෙවින් ස්වර්ණමය කැටයමින් යුත් තහඩුවකින් සරසා තිබේ. කරඬුව තඹ හෝ පිත්තලෙන් තනා රිදියෙන් ඔප දමා මැණික් එබ්බූ රිදී කැටයම් සහිත මතුපිටක් ඇති විශාල සිංහාසනයක් මත තබා තිබේ. දළදා වහන්සේ තැන්පත් කොට පෙරහැරේ ගෙන යනු ලබන කරඬුව ද වීදුරු ආවරණය තුළ තැන්පත් කොට තිබේ. එය රනින් නිමවා ඇති අතර වෛරෝඩි සහ වෙනත් මැණික් වර්ගවලින් සරසා ඇත. තක්ෂිලාවේ ධර්මරාජික ස්තූපයෙන් සොයාගත් ධාතූන් වහන්සේලා සමග ඉන්දීය ආණ්ඩුවෙන් පරිත්‍යාග කරන ලද කරඬුවක්'ද මෙහි ඇත.

මතුපිට රන් තහඩුවෙන් ආවරණය කළ මේසයකි. එය පූජාසනයයි. පූජාසනයට ඉහළින් මැණික් ඔබ්බවා ඇති ස්වර්ණමය පද්මයකි. ඒ ඉදිරිපිට විදුලි පහනක් සහිත විදුලි පංකාවකි.

ගන්ධකුටිය තුළ රනින් හැඩ වැඩ කළ තිර හතරකි. එයින් පළමුවැන්න පිවිසෙන දොරටුව අබියස ද දෙවැන්න ගන්ධකුටියේ දොරටුවට මඳක් ඉදිරියෙන්

ද දොරත් තිරයත් අතර මිනිසෙකුට සිටිය හැකි ඉඩ ප්‍රමාණයක් ඇත. ගන්ධකුටියේ දොර තේවාව සඳහා වසන කල්හි මේ තිරය අදිනු ලැබේ. එහෙත් කෙනෙකුට එහි එක පැත්තක සිට දොරෙන් ඇතුළට හා පිටතට ගෙන යන්නේ කුමක්දැයි දැකිය හැකිය. ඊට කිසි විරුද්ධතාවක් නොනැගේ. ගන්ධකුටියේ දොරට ඇතුළින් ඇති තුන්වන තිරය චාම් එකකි. එය තේවාව සිදුවන වේලාවේ පූජා ද්‍රව්‍ය ඇතුළට හා පිටතට ගෙන යාම සඳහා දොර විවෘතව තැබිය යුතු විට ඇතුළත කෙරෙන පූජාවිධි පිටත සිටින්නවුන්ට දර්ශනය නොවීම සඳහා අදිනු ලබන්නකි. සිව්වන තිරය වැඩ සිටින මාලිගාවේ ඇතුළත එල්ලා ඇති අතර තේවාව අවසන් කිරීමේදී එය අදිනු ලැබේ.

පළමුවන ඇතුළු කුටියට දකුණු පැත්තේ පිටතින් ඇති පටු ගමන් මග කවිකාර මඩුව නමින් හැඳින්වේ. මේ ඇතුළු කුටියේ වම් පසින් පිටවන පිටදොර තිබේ. දෙවන ඇතුළු කුටියට හා ගන්ධකුටියට දකුණු පසින් ඇති කාමර දෙක කත්තියන බරාඳය නම්වේ. මේ කොටස් දෙක ඇතුළත හා පිටත යයි නම් කරමි. ඒ පූජාවට ගෙනෙන සියලු ආහාර මෙහි තබන හෙයිනි. තේවාව සඳහා උපයෝගී කරගන්නා රන් පාත්‍ර අභ්‍යන්තර ගබඩාවේ තබනු ලැබේ. මිදුලේ ඇති ගන්ටාව නාද කළ කල්හි බාහිර ගබඩාවේ බිත්තිය අතරින් එම පාත්‍ර ඉදිරියට යැවේ. අනෙක් පස ඇති කාමර දෙක ගෙපලුම් බරාඳයයි. කවිකාර මඩුවේ උපකරණ මෙහි තැන්පත් කරනු ලැබේ.

මේ දෙකින් පළමු වැන්න ආලත්ති බරාඳය යනුවෙන් හැඳින්වේ. ගන්ධ කුටිය පිටුපසින් ඇත්තේ හළු මණ්ඩපයයි. තේවාවට ගන්නා හඳුන් ද බුදුන් වහන්සේගේ සිවුරු හෝ රජතුමාගේ ආභරණ මෙහි තබනු ලැබේ.

මාලිගාව ඇතුළත දකුණු පැත්තෙන් දොරටු දෙකකි. බටහිර දිග කොණේ ඇති එකක් නගරය දෙසට විහිදේ. මුළුතැන් ගේ සහ දාන ශාලාව අතරින් ඇති අනෙක් දොරටුව තේවාවේ යෙදෙන භික්ෂූන් වහන්සේගේ වාසස්ථානය වන මාලිගාවේ පන්සලට පිවිසීම සඳහා වූවකි.

අනුරාධපුරයේ සිට මහනුවර දක්වා වැඩම කළ දළදා වහන්සේ උදෙසා වරින් වර විවිධ රාජධානිවල ඉදිවූ සියලු දළදා මැඳුරුවල සැලසුම් ඒකාකාර බව හා නොවෙනස්ව පැවැති බව තහවුරු වේ. දළදා මැඳුරේ ඉහළ මාලය ධාතු සරය වශයෙන්ද පාත මාලය පටිමාඝරය වශයෙන් ද පැවැති බව පෙනේ. වැඩසිටි මාලිගාවේ පිළිමගෙය අද දින හිස්ව පවතින්නේ වුවද එම අඩුපාඩුව පල්ලේමාලය නමින් කීර්ති ශ්‍රී රජුන් විසින් ඉදිකරන ලද දැනට පත්තිරිප්පුව යාබද පිළිමගෙයින් එය සඵල වී ඇත. එහි ශ්‍රී වික්‍රමරාජසිංහ රජුගේ අනුරුවක්ද අද දින දක්නට ලැබේ.





## දළදා පූජා හා වත්පිළිවෙත්

තේවා කරන භික්ෂූන් වහන්සේ මහා විහාර දෙකේ ජ්‍යෙෂ්ඨ භික්ෂූන් වහන්සේ අතරින් තෝරා ගනු ලැබේ. විහාර දෙකම වසරින් වසර මාරුවට තේවාව භාරගනී. එක් වසරක ආරම්භය සේ සැලකෙන්නේ වස්සාන කාලයේ ආරම්භයයි. උඩුමාලේ ගඳකිලියේ දෙනමක්ද පල්ලේ මාලයේ පිළිමගේ එක නමක්ද වශයෙන් භික්ෂූන් වහන්සේ තෙනමක් සාමාන්‍යයෙන් දළදා තේවාවේ යෙදෙති. පල්ලේ මාලේ කලින් තේවාව කොට ඇති භික්ෂූන් වහන්සේලා පමණක් උඩුමාලේ තේවාව සඳහා තෝරාගනු ලැබේ. අනෙක් මහා විහාරයේ භික්ෂූන් වහන්සේලා දළදා තේවාව භාර ගන්නා තුරු මේ භික්ෂූන් වහන්සේලා දළදා මාලිගාවේ ම නේවාසිකව වැඩ සිටීම චාරිත්‍රයකි.

දළදා මාලිගාවේ පුද පූජා පවත්වන නිලධාරීහු දෙ කොටසක් වෙති. ඇතුල් කට්ටලේ සහ පිට කට්ටලේ යන වශයෙනි. මෙයින් දෙවනුව කී පිට කට්ටලේ නිලධාරීන් වැඩ සිටින මාළිගෙයින් පිටත ඔවුන්ගේ සේවාවන් කරන අතර ඇතුල් කට්ටලේ නිලධාරීහු ප්‍රධාන දළදා මන්දිරය තුළ ඔවුන්ගේ රාජ කාර්යයන් ඉටු කරති. මෙයින් ඇතුල් කට්ටලේට අයත් නිළධාරීන්ගේ ප්‍රධානත්වය

මල්වතු - අස්ගිරි උභය මහා විහාරයන්හි අතිගරු මහානායක ස්වාමීන්ද්‍රයන් වහන්සේලා දරන අතර පිට කට්ටලේ දියවඩන නිලමේතුමා විසින් මෙහෙය වනු ලබයි. රාජකාර්යයන් හා නිලධාරීන් පිළිබඳ මේ ක්‍රමය ඉපැරණි රජවරුන්ගේ කාලයේ පැවැති රාජමාලිගා පරිපාලනය පිළිබඳ ක්‍රමයම තව දුරටත් පවත්වාගෙන ඒමකි.

වර්තමානයෙහි පවත්වනු ලබන පූජා චාරිත්‍ර විධි පහත දැක්වෙන පරිදි වර්ග කළ හැකිය.

(අ) දෛනික තුන්වරු පූජා (තේවා) - අලුයම පූජාව මධ්‍යාහ්න හෙවත් නව පැය පූජාව සහ සවස පූජාව එයින් අදහස් කෙරේ. මේ අවස්ථාවලදී ආහාර මල් පහන් තෙල් සහ ජලය පූජා කෙරේ.

(ආ) සප්තාහික පූජා - සතියේ සෑම බදාදා දිනකට පමණක් සීමා වූ විශේෂ පූජාවකි. දළදා වහන්සේ ස්නානය කරවීමේ සංකේතාත්මක පූජා විධියක් වන මෙය නානුමුර මංගල්ලේ යන නමින් හැඳින්වේ. අනික් සප්තාහික පූජා විධි අමාවක පුර අටවක, පුර පසළොස්වක හා අව අටවක යන පෝය දිනවල පවත්වනු ලැබේ.

(ඉ) විශේෂ මාසික පූජා වත් පිළිවෙත් පුර පසළොස්වක පොහෝ දිනවල පැවැත්වේ. එයට හේතුව වන්නේ පුර පසළොස්වක පොහෝ දිනය බුද්ධ චරිතය හා බුද්ධ ශාසනය හා සම්බන්ධ වැදගත් සිදුවීම් රාශියක් සිදු වූ උතුම් දවසක් වශයෙන් බෞද්ධයින් විසින් සලකනු ලබන හෙයිනි.

(ඊ) වාර්ෂික පූජා වත් පිළිවෙත්වලට පහත දැක්වෙන උත්සව ඇතුළත් වේ. ජනවාරි මාසයේ පැවැත්වෙන අලුත් සහල් මංගල්‍යය, අප්‍රේල් මාසයේ පැවැත්වෙන අවුරුදු මංගල්‍යය, ජූලි - අගෝස්තු මාසවල පැවැත්වෙන වැසි ලබා ගැනීමේ පූජා විධියක් වන ඇසළ මංගල්‍ය, නොවැම්බර් මාසයේ පැවැත්වෙන කාර්තික මංගල්ලය.

එදා කන්ද උඩරට රාජධානිය තුළ පැවැති සතර මහා මංගල්‍යය අද දිනත් දළදා මාලිගය ඇසුරු කොට පැවැත්වෙන අතර ඒ අතුරින් ඉතාම විචිත්‍රවූත් ජාතික හා ආගමික උත්සවය වන්නේ වාර්ෂික ඇසළ මහා පෙරහරයි. දළදා මාලිගෙය ඇසුරු කොට පවත්නා පුද පූජා වත් පිළිවෙත් වූ කලි ශත වර්ෂ ගණනාවක් අප රටේ පවත්නා වූ බෞද්ධ චාරිත්‍ර වාරිත්‍ර හා සම්ප්‍රදායක අවශේෂයන් බව අමතක නොකළ යුතුය. එය ලෝක බෞද්ධ ශිෂ්ටාචාරය තුළ අද දින දක්නා ලැබෙන ජීවමාන නිදර්ශනයකි.

සැකසුම - මහාචාර්ය අනුරාධ සෙනවිරත්න මහතා


ශ්‍රී දළදා මාළිගාව - මහනුවර
SRI DALADA MALIGAWA - KANDY